# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2406/34 – 2024 ඔක්තෝබර් මස 20 වැනි ඉරිදා – 2024.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

යොමු අංකය: IR/COM/02/2023/90.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

අංක 2398/49 දරන හා 2024.08.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 15, රොද්‍රිගෝ පෙදෙස, නො. 42 හි පදිංචි ශිල්ප ප්‍රදර්ශකයින්ගේ වෘත්තීය සමිතිය සහ කොළඹ 10, ටී. බී. ජයා මාවත, ජනවතු පියස, 320 හි පිහිටි ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක අංක A 02/2024 දරන හා 2024.07.01 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 02/2024 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2025.08.23 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**(3 වන නියෝගය)**

**'අ' ආකෘති පත්‍රය**

***1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත***

*බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම*

ලිපිනය: ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, අංක 320, ''ජනවතු පියස'', ටී. බී. ජයා මාවත, කොළඹ 10.
දිනය: 2024.09.30

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2024.08.24 දිනැති අංක 2398/49 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද ශිල්ප ප්‍රදර්ශකයින්ගේ වෘත්තීය සමිතිය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය බැඳි සිටින්නාවූ ද 2024.07.01 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**එච්. අතාවුද සෙනෙවිරත්න,**
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,
නො.320 ''ජනවතු පියස'', ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

පිටපත (පළමු පාර්ශ්වය) ශිල්ප ප්‍රදර්ශකයින්ගේ වෘත්තීය සමිතිය, නො. 42, රොද්‍රිගෝ පෙදෙස, කොළඹ 15 වත (ලි.ප.තැ) මගින් යොමු කරන ලදී.

EOG 10 - 0157

---

මගේ අංකය: IR/COM/03/2023/55.

**කාර්මික ආරාවුල් පනත – 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.06.20 දිනැති හා අංක 2390/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ* ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2024.06.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කනත්තේවැව, කු/මල්වාන, "තිළිණ" මාවත හි පදිංචි ජේ. ගාමිණී ජයවර්ධන මහතා සහ අතුරුගිරිය, බොරැල්ල පාර, අංක 179 හි පිහිටි නිසාකෝ ෆර්නිචර් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 27/2024 හා 2024.09.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 14 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

බේරුම්කරුඃ නීතිඥ සී. ඒ. එච්. එම්. විජේරත්න
යොමු අංකය : IR/COM/03/2023/55.
නඩු අංකය : A/27/2024.

ජේ. ජී. ජයවර්ධන මහතා,
"තිළිණ" මාවත, කු/මල්වාන,
කනත්තේ වැව.

*පළමු පාර්ශ්වය*

නිසාකෝ ෆර්නිචර්,
179, බොරැල්ල පාර,
අතුරුගිරිය.

*දෙවන පාර්ශ්වය*

ප්‍රදානය

ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ජේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් මා පත් කොට 2024 ජූනි මස 20 දින දරන ලිපිය මඟින් මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වූයේ "නිසාකෝ ෆර්නිචර් ආයතනයේ සේවය කළ ජේ. ගාමිණී ජයවර්ධන මහතාට 2014 ජනවාරි සිට 2018 ජූනි මාසය දක්වා කාලයට වැටුප් පත්‍රිකාවේ සඳහන් Second Service Charge මුදල ලබා ගැනීම සඳහා හිමිකමක් තිබේද? යන්න සහ හිමිකමක් තිබේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද?" යන්න පිළිබඳව වේ.

බේරුම්කරණ විභාගය පැවැත්වූ ආකාරය සාක්ෂි විභාගය සහ නිරීක්ෂණය

මෙම නඩු විභාගය 2024-07-15, 2024-07-29, 2024-08-22 සහ 2024-09-05 දිනයන්හි කොළඹ කාර්මික අධිකරණයේදී පැවැත්විය. මෙම දිනයන් නියම කරන ලද්දේ බේරුම්කරණ යොමුවට අදාළව කරුණු ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලුම්කාර පාර්ශ්වය සහ වග උත්තරකාර පාර්ශ්වයට දින 14 බැගින් කාල සීමාවන් ලබාදීමෙනි.

අදාළ ප්‍රශ්නයට හැකිතාක් දුරට ලිඛිතව සාක්ෂි ලබා ගන්නා ලදී. ඉතා සීමිත අවස්ථාවකදී පමණක් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් කර ගන්නා ලදී.

වග උත්තරකාර දෙවැනි පාර්ශ්වය විසින් බේරුම්කරණ අධිකරණයට දන්වා සිටියේ පළමු පාර්ශ්වය විසින් මෙම ආයතනයෙහි සේවය කරන ලද කාලසීමාව තුළ සිදුකරන ලද අක්‍රමිකතා හා නීති විරෝධී ක්‍රියාවන් නිසාත් ඔහුගේ කැමැත්තෙන් ඉල්ලා අස්වීම නිසාත් සේවක මහත්ම මහත්මීන්ගේ යහපත උදෙසා රක්ෂණ ආවරණය ලබාදීම මෝටර් සයිකල් සඳහා ණය මුදල් ලබාදීම විදේශ සංචාර සහ විනෝද චාරිකා සඳහා එක් එක් සේවක මහත්ම මහත්මීන් සඳහා ඇති කර ඇති 2nd Service Charge නමින් අරමුදලින් වාසි ලබා ගැනීමට නොහැකි බවයි.

එම අරමුදල සේවකයන් විශ්‍රාම යන අවස්ථාවේදී ඔහු හෝ ඇයගේ වියදම් මුදල් අඩුකර ඉතිරි මුදල යහපත් කල් ක්‍රියාවෙන් සේවය නිරත වූ අයට පමණක් විශ්‍රාම යන අවස්ථාවේදී ගෙවනු ලබන බවයි. මෙම දීමනාව ඉහළ කළමනාකාරීත්වයේ පූර්ණ අභිමත පරිදි ගෙවනු ලබන බවත් එය ව්‍යවස්ථාපිත දීමනාවක් නොවන බවද දන්වන ලදී.

පළමු පාර්ශ්ව විසින් දන්වා සිටියේ තමා කිසිදු වංචනික හෝ නීති විරෝධී ක්‍රියාවන් සිය සේවා කාලය තුළ කර නොමැති බවත් තමා වයස 56 දී සේවය කිරීමට අපහසුතාවය මත සේවයෙන් ඉල්ලා අස් වූ බවයි. ඒ අනුව ඔහු විශ්‍රාම යා යුතු වයස වූ වසර 55 ඉක්මවා තිබූ බව ද සඳහන් කරන ලදී. 2nd Service Charge පිළිබඳව ඔහුගේ මාසික වැටුප් විස්තරයේ සඳහන් බවයි. එම කරුණු සත්‍ය බව දෙවන පාර්ශ්වය පිළිගන්නා ලදී.

### නිරීක්ෂණය

1. පළමු පාර්ශ්වය විසින් කරන ලදැයි කියන, චෝදනා එම පාර්ශ්වය විසින් හිතාමතා හෝ වංචනිකව සිදු කරන ලද ඒවා නොවන බව නිරීක්ෂණය විය. එම ක්‍රියාවන් අතපසුවීම් හෝ නොසැළිකිලිමත් බව හෝ අනවධානයෙන් සිදුවූ සිද්ධීන් බව නිරීක්ෂණය විය.

2. 2nd Service Charge යන අරමුදල පිළිබඳව ආයතයේ සියලුම නිලධාරීන් සහ සේවක මහත්ම මහත්මීන් දැනුවත් වී ඇති අතර ඒ පිළිබඳව තමා විශ්‍රාම යන අවස්ථාවේදී යම්කිසි දීමනාවක් ලැබෙන බවට විශ්වාසයක් පවතී. එබැවින් එය ව්‍යස්ථාපිත අරමුදල නොවේය යන්න පිළිගත නොහැකියි.

3. පළමු පාර්ශ්වය විසින් ආයතනයෙහි ගොඩනැගිල්ලක වහලයකට කරන ලද හානියක් සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් චෝදනා කරන ලද අතර එය පිළිගෙන එම අවස්ථාවේදී පළමු පාර්ශ්වය විසින් දෙවන පාර්ශ්වය සමග ගනුදෙනු කරන ආයතනයකට රුපියල් 20,000 මුදලක් ගෙවන ලද බවත් එම වහල අලුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා ඇති බවත් ඒ බව දෙවන පාර්ශ්වය දැනුවත් බවත් නිරීක්ෂණය විය. එය ඉටු කර ගැනීම දෙවන පාර්ශ්වයෙහි යුතුකමක් හා වගකීමක් වෙයි. මෙම අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම යුක්ති යුක්ත නොවේ.

4. 2nd Service Charge අරමුදල ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ කිසිදු ලියවිල්ලක් දෙවන පාර්ශ්වය ඉදිරිපත් කරන ලද්දේ ද නැත. එබැවින් ඒ පිළිබඳ ප්‍රතිපත්ති මාලාවක් එම මුදල ලබා දෙන්නේ කෙසේද යන්න පිළිබඳව ලිඛිතව සියළුම නිලධාරී සේවක මහත්ම මහත්මීන් දැනුවත් කරන ලෙස දෙවන පාර්ශ්වයට යෝජනා කරමි.

### නිගමනය

පළමු පාර්ශ්වය ආයතනයෙන් ඉවත් වී ඇත්තේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීම නිසා ඔහු සේවයෙන් විශ්‍රාම ගොස් ඇතැයි සැලකීමට දෙවන පාර්ශ්වයට ඉඩ තිබුණි. ඔහු විසින් කිසිදු අවස්ථාවක වංචනික ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවන් සිදුකර නොතිබූ හෙයින් වරින් වර සිදුවී තිබූ සිද්ධීන් ඔහුගේ නොසැලකිල්ල හෝ අනවධානය නිසා සිදුවූ සිද්ධීන් බවත් එම සියලුම අවස්ථාවන්හිදී තමාට සමාව ලබා දී සේවය කිරීමට ඔහුට අවස්ථාව දෙවන පාර්ශ්වය විසින් ලබා දී තිබුණි. එබැවින් එම සිද්ධීන් නැවත නැවතත් සඳහන් කරමින් පළමු පාර්ශ්වයට ලැබෙතැයි විශ්වාසයෙන් සිටි 2nd Service Charge මුදල නොදීම යුක්ති සහගත නොවේ.

පළමු පාර්ශ්වය විසින් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ලැබිය යුතු මුදල පහත දක්වා තිබුණි.

| | |
|---|---|
| 2014 වර්ෂය සඳහා | රුපියල් 22,743.00 |
| 2015 වර්ෂය සඳහා | රුපියල් 43,383.00 |
| 2016 වර්ෂය සඳහා | රුපියල් 27,846.00 |
| 2017 වර්ෂය සඳහා | රුපියල් 33,569.00 |
| 2018 වර්ෂය සඳහා | රුපියල් 17,140.00 |
| එකතුව | රුපියල් 144681.00 |

කෙසේ වෙතත් දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර සිටියේ පළමු පාර්ශ්වයට ලැබිය යුතු මුදල රුපියල් 152544.00ක් බවයි. මෙම අරමුදලින් විශ්‍රාම යන අවස්ථාවේදී මුදල් ගෙවා තිබුණේ කිසිදු විනය විරෝධය ක්‍රියාවන්ට සම්බන්ධ නොවී අවංකව සහ විනීතව සේවය කොට ආයතනයෙන් විශ්‍රාම ගිය සේවක මහත්ම මහත්මීන්ට පමණක් බව ද වගඋත්තරකාර ආයතනය දැන්විය.

එබැවින් මෙම සේවකයා සම්බන්ධයෙන් විශේෂයක් කළහොත් ආයතනයේ විනය පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් ඇතිවිය හැකි බවයි. කෙසේ වෙතත් පළමු පාර්ශ්වයේ සේවා කාලය ඔහුගේ වත්මන් ආර්ථික තත්ත්වයන්ද සැලකිල්ලට ගෙන සානුකම්පිතව දීමනාවක් ගෙවීමට දෙවන පාර්ශ්වය එකඟ විය.

ප්‍රදානය

දෙපාර්ශ්වයේම එකඟතාවය මත රුපියල් ලක්ෂයක (100000/-) මුදලක් සානුකම්පිත දීමනාවක් ලෙස දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයට ගෙවන ලෙස මෙයින් නියම කරමි. ඒ අනුව චෙක්පත් අංක 762807 දරණ HNB බැංකුව මගින් නිකුත් කරන ලද 100000/- වටිනා චෙක්පත් පළමු පාර්ශ්වයට 2024.09.04 දින මෙම අධිකරණයේදී දෙවන පාර්ශ්වය විසින් බාරදී මෙම ආරාවුල සමථයට පත් කරන ලදී.

ඉහත සඳහන් ප්‍රදානය කිරීම් යුක්ති සහගත හා සාධාරණ බවද ප්‍රකාශ කරමි

**නීතිඥ** සී. ඒ. එච්. එම් විජේරත්න,
බේරුම්කරු.

2024 සැප්තැම්බර් 16 වැනි දින
කාර්මික අධිකරණයේදී ය

EOG 10 - 0158

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.